# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2328/19 - 2023 අප්‍රේල් මස 21 වැනි සිකුරාදා - 2023.04.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්. ඩී. බී. 5/2005**

**2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත**

8 වන වගන්තිය යටතේ වූ නියමය

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 8 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා විසින් මේ නියමය මගින් -

(1) 2021 දෙසැම්බර් 21 දිනැති අංක 2259/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ 3 වන ඡේදයේ සඳහන් 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 8 වන වගන්තිය යටතේ සාදන ලද නියමය, ''රුපියල් පන් ලක්ෂයකට (රු. 500,000/=) අඩුවිය යුතු බවට'' යන වචන සහ ඉලක්කම් වෙනුවට, ''රුපියල් මිලියන එකක් (රු. 1,000,000/=) හෝ ඊට අඩු විය යුතු බවට'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, සංශෝධනය කරනු ලැබේ ; සහ

(2) ඉහත *ගැසට් පත්‍රය* යටතේ දැනටමත් ආරම්භ කර ඇති සමථකරණයන්ට සහ ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවිය යුතු බව ප්‍රකාශ කරනු ලැබේ.

*ජනාධිපති නීතිඥ ආචාර්ය* **විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0140

1A - G 39367 — 26 (2023/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*